16 වන පිටෙන්

සාමාන්‍ය ව්‍යවහාරයේ භාවිත වන "හය වරක් හත, හතලිස් දෙක" වේ. (*6 x 7 = 42*) .

මේ ආකාරයටම වගුවේ ඉහලම තිරස් තීරුවේ, අංක 7 ඔස්සේ පහලට පැමිණ, වම්පස ඇති අංක 6 ට අදාළ තීරුව ඔස්සේ දකුණට ගොස් සිරස් තීරුව සහ සහ තිරස් පේලිය හමුවන ස්ථානයේ අංකය 42 කලින්ද සඳහන් කළ සාමාන්‍ය වියවහාරයේ භාවිත වන "හත් වරක් හය , හතලිස් දෙක" (*7 x 6 = 42*) ලෙසද සැලකිය හැකිය.

මෙසේ බලන කළ මේ උදාහරණයෙන් දැක්වෙන ආකාරයට හයේ ගුණිතයන් සහ හතේ ගුණිතයන් දෙකම එකවර හඳුනා ගත හැකිය. වෙනස් ආකාරයකට විස්තර කළහොත් 'හය වරක් චක්කරය සහ හත්වරක් චක්කරයී එක වරටම දකින්නට ලැබේ. වගුවේ ඕනෑම ස්ථානයක මෙම ලක්ෂණය තිබේ.

මෙයින් පැහැදිලි වනුයේ, පයිතග රසියානු ගුණිත වගුව මගින් වැඩි සංඛ්‍යා හරඹයක් නොමැතිව, අවශ්‍ය දේ ඉතාමත් සරලව සහ තර්කානුකූලව පෙන්වා දෙන බවයි. දශක කිහිපයකට පෙර අධ්‍යාපනය ලැබූ බොහෝ අයට, ඔවුන් භාවිත කළ මුලින් දැක්වූ 'වරක් චක්කරයි මෙම පයිතගරසියානු ගුණිත වගුව සමග සංසන්දනය කළ විට මෙහි තිබෙන වෙනස සහ පැහැදිලි භාවය පහසුවෙන්ම හඳුනා ගත හැකිවනු ඇත.

## පයිතගරස්ගේ ගණිත වගුවේ පහසුව සහ සංඛ්‍යා රටා

| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
| 2 | 2 | 4 | 6 | 8 | 10 | 12 | 14 | 16 | 18 |
| 3 | 3 | 6 | 9 | 12 | 15 | 18 | 21 | 24 | 27 |
| 4 | 4 | 8 | 12 | 16 | 20 | 24 | 28 | 32 | 36 |
| 5 | 5 | 10 | 15 | 20 | 25 | 30 | 35 | 40 | 45 |
| 6 | 6 | 12 | 18 | 24 | 30 | 36 | 42 | 48 | 54 |
| 7 | 7 | 14 | 21 | 28 | 35 | 42 | 49 | 56 | 63 |
| 8 | 8 | 16 | 24 | 32 | 40 | 48 | 56 | 64 | 72 |
| 9 | 9 | 18 | 27 | 36 | 45 | 54 | 63 | 72 | 81 |

ගුණිත වගුවේ 'රටා' හඳුනා ගනිමු

පැරණි චක්කරයේ මෙන් මෙම වගුවේ අනවශ්‍ය තොරතුරු හෝ අනවශ්‍ය ඉඩකඩ ගැනීමක් සිදු නොවේ.

- වගවු තේරුම් ගැනීම පහසයු .
- මෙහි සිසුවාට අවශ්‍ය තොරතුරු ලබාගැනීම පිණිස, තරමක් දුරට සිතීම සඳහා සලස්වා තිබේ. පැරණි එකෙහි කෙලින්ම පිළිතුර දී තිබේ.
- මෙහි යම්කිසි 'රටා' කිහිපයක් ඇති නිසා බලෙන් කට පාඩම් නොකළේ වුවද මතක තබා හැකිය.
- මිනිස් මනසෙහි බොහෝ දේ රැඳී සිටිනුයේ සමාන අසමාන කම් විවිධ රටා ඔස්සේ තේරුම් ගත් විටය.
- මෙම වගුවෙහි වම් පැත්තේ මුදුනෙහි (අංක 1) සිට දකුණු පැත්තේ පහල අග්‍රය (අංක 81) දක්වා විකර්ණ (*diagonal*) රේඛාවක් ගතහොත් එම රේඛාව දෙපැත්තේ ඇති සංඛ්‍යාවල සමමිතික රටාවක් තිබේ. පැරණි 'චක්කරවල' එසේ රටා නොමැත.
- මෙම විකර්ණ රේඛාව ඔස්සේ පිහිටන සියලුම සංඛ්‍යා (1, 4, 9, 16, 25, 36, ... ආදී වශයෙන්) අනු පිළිවෙලට, වගුවේ පළමු සිරස් පේළියේ අදාළ සංඛ්‍යාවේ වර්ග සංඛ්‍යාව බව පෙනේ. මෙයද රටාවකි.
- වගුවේ විකර්ණය දෙපැත්තේ සංඛ්‍යා පිහිටන ආකාරයේද (අංක 12, 16, 35 වැනි) සමමිතික රටා රාශියක්ද දකින්නට ලැබේ.

යම්කිසි ඉගෙනුම් ක්‍රියාවලියකදී පැහැදිලිව පෙනෙන රටා ඇතිවිට එම ඉගෙනුම වඩා ප්‍රබෝධමත් වේ. විද්‍යාව, ගණිතය විෂයය වල පමණක් නොව සංගීතය, චිත්‍ර කලා වැනි අනිකුත් විෂයය වලද ඉගෙනුම සඳහා උපයෝගී කරගතහැකි රටා බෙහෙවින් තිබෙන බව හඳුනා ගත හැකිය.
මේ ආකාරයට රටා හඳුනාගෙන ලබාග න්නා අවබෝධය සහිත දැනුම ගිරවුන් මෙන් කටපාඩම් කර ගැනීමෙන් ලබන (*rote learning*) අසම්පූර්ණ දැනුමට වඩා බෙහෙවින් ප්‍රයෝජනවත්ය. දශක හතකට පමණ ඉහතදී කෙසේ වෙතත්, අද ඇති තාක්ෂණ දියුණුව නිසා මෙවැනි වගු නොමැතිව වුවද වැඩ කටයුතු කර ගත හැකිය.

අධ්‍යාපන ක්‍රියාවලියේදී ගුරු උපදෙස් අවශ්‍යවේ. එමෙන්ම අත්දැකීම් මගින් ලැබෙන සංජානනය (චැරජැචඑසදබ) ආශ්‍රිතව ප්‍රත්‍යක්ෂ භාවය ලැබීම සහ තහවුරු වීම ඉතාමත්ම සඵල ඉගෙනුම් මගයි.

## දරුවන්ට ලබාදිය යුතු ගණිත වගුව,




දරුවන්ට ඉදිරිපත් කළ යුතු ගණිත වගුව

කෙසේ වෙතත් ඔබගේ දරුවන් හෝ මුණුපුරු මිණිපිරියන් තවමත් ඉගෙනුම් මගෙහි ලාබාල අවස්ථාවල නිරතව සිටිත් නම්, ඔව්හු තවමත් අධ්‍යාපන වටිනාකමින් අඩු මෙම පැරණි 'චක්කර' භාවිත කරන්නේද යන්න ගැන විමසිලිමත් වන්න. පහසුවෙන් තේරුම් ගතහැකි රටා සහිත පයිතගරසියානු ගුණිත වගුව දරුවන්ට ලබාදී ගණිතයේ නීරස කොටසක් ඉතා ප්‍රබෝධමත් ඉගෙනුම් මගක් කරවන්න.

